සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade: 6 ශ්‍රේණිය	භූගෝල විද්‍යාව I - II	කාලය / நேரம் / Time: පැය 02 යි

නම / பெயர் / Name: .....

විභාග අංකය / சுட்டிலக்கம் / Index No.: .....

- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව I පත්‍රයේ සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

- අංක 01 සිට 05 තෙක් දී ඇති ප්‍රශ්නවලට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

1. ඔබ පාසල පිහිටා ඇති කුඩාම පරිපාලන ඒකකය ..... වේ.
   (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය / ග්‍රාම නිලධාරී කොට්ඨාශය / දිස්ත්‍රික්කය)

2. නිවැරදිව දිශාව හඳුනාගැනීමේ දී ..... භාවිත කරයි.
   (මාලිමාව / අනිලමානය / සුළං දිශා දර්ශකය)

3. වගාවට හානි කරනු ලබන ගොළුබෙල්ලන් විනාශ කරන්නේ, ...
   (ඇටි කුකුළා/ ගිරවා/ කපුටා)

4. ..... පිත්තල භාණ්ඩ නිෂ්පාදනය සඳහා ප්‍රසිද්ධ ප්‍රදේශයකි.
   (පිළිමතලාව/ දුම්බර / රදාවඩුන්න)

5. ශ්‍රී ලංකාවට දකුණු දෙසින් ..... සාගරය පිහිටා ඇත.
   (ඉන්දියන් / පැසිපික්/ අරාබි)

- අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (නි) ලකුණ ද, වැරදි නම් (වැ) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.

6. සුළඟේ දිශාව තීරණය කිරීම සඳහා සුළං දිශා දර්ශකය භාවිතා කරයි. ( )
7. තදින් හමන සුළං 'සුළි සුළං' වේ. ( )
8. සෞඛ්‍ය සහ අධ්‍යාපනය නොමිලයේ සැපයෙන සේවාවන් දෙකකි. ( )
9. ජලය ජීවීන්ගේ පැවැත්මට අත්‍යවශ්‍ය ස්වභාවික සම්පතකි. ( )
10. අම්ල වැසි ඇතිවීම වායු දූෂණය නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵලයක් නොවේ. ( )

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට අදාළව නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.

11. කුරුණෑගල නගරය පිහිටා ඇත්තේ ..... පළාතේ ය.
12. යම් ස්ථානයක කෙටි කාලයක් තුළ පවතින වායුගෝලීය ස්වභාවය ..... ලෙස හඳුන්වයි.
13. මිනිසාට මහාමාරිය රෝගය බෝ කරනුයේ ..... විසිනි.
14. අපද්‍රව්‍ය නැවත භාවිතයට ගැනීම ..... ලෙස හඳුන්වයි.
15. සිසිලිය දූපත පිහිටියේ ..... මුහුදේ ය.

Past Papers Wiki

- අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

16. නැගෙනහිර හා දකුණු දිශාව අතර පිහිටි දිශාව වන්නේ,
(1) ගිණිකොණ (2) නිරිත (3) වයඹ (4) ඊසාන

17. පාසල අවට භූ දර්ශනයේ දැකිය හැකි මානව නිර්මාණයකි.
(1) ප්‍රධාන මාර්ගය (2) ගංගාව (3) වනාන්තර (4) උස් බිම්

18. පස සෝදා යෑම වැළැක්වීම සඳහා යොදා ගන්නා පියවරකි,
(1) පස් කඳු කැපීම (2) වනාන්තර එළිපෙහෙළි කිරීම.
(3) ගල් වැටි බැඳීම (4) භූමිය මතුපිට ආවරණය ඉවත් කිරීම.


19. බලශක්තිය අපරිමැස්මෙන් භාවිත කළ අවස්ථාවක් **නොවන්නේ,**
(1) ප්‍රසංහිත ප්‍රතිදීප්ත (CFL) විදුලි පහන් භාවිතය.
(2) ආලෝක විමෝචක ඩයෝඩ (LED) බල්බ භාවිතය.
(3) කාර්යක්ෂම දර උදුන් භාවිතය.
(4) විදුලි ස්ත්‍රික්කය භාවිත කරන කාලසීමාව සහ වාර ගණන වැඩි වීම.

20. ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාණිජ්‍ය වරාය,
(1) කොළඹ වරාය (2) ත්‍රිකුණාමල වරාය
(3) ගාල්ල වරාය (4) හම්බන්තොට වරාය (ලකුණු 2x20=40)

II පත්‍රය

- මෙහි පළමු ප්‍රශ්නයට අනිවාර්යයෙන් පිළිතුරු සැපයිය යුතුය.
- ප්‍රශ්න අංක 02 සිට 07 තෙක් දී ඇති ප්‍රශ්න හතරක් තෝරා ගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

1) (අ) පහත දී ඇති ශ්‍රී ලංකාවේ සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.



(i) ඔබගේ පාසල පිහිටි දිස්ත්‍රික්කයට අදාළ අක්ෂරය නම් කරන්න.
(ii) ශ්‍රී ලංකාවට අයත් විශාලතම දූපත දැක්වෙන අක්ෂරය නම් කරන්න.
(iii) E අක්ෂරය මගින් දක්වා ඇති දිස්ත්‍රික්කය නම් කරන්න.
(iv) සිතියමෙහි සේයා කර ඇති පළාත නම් කරන්න.
(v) කෝනේෂ්වරම් කෝවිල පිහිටා ඇති දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය නම් කරන්න.
(vi) ශ්‍රී ලංකාවේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පිහිටි දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය නම් කරන්න.

(ලකුණු 06)

(ආ) පහත දී ඇති ලෝක සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයෙහි ලියා දක්වන්න.

(i) ලොව විශාලතම මහද්වීපය දැක්වෙන අක්ෂරය කුමක්ද?


(ii) C අක්ෂරයෙන් දැක්වෙන දූපත නම් කරන්න.

(iii) D අක්ෂරයෙන් දැක්වෙන සාගරය නම් කරන්න.

(iv) F අක්ෂරය මගින් දැක්වෙන බොක්ක නම් කරන්න.

(v) උතුරු ඇමරිකා මහද්වීපය දැක්වෙන අක්ෂරය වන්නේ?

(vi) E අක්ෂරයෙන් දැක්වෙන දූපත කුමක්ද?



(ලකුණු 06)

2)



(i) මෙම රූප සටහනේ දැක්වෙන උපකරණය නම් කරන්න. (ල. 02)

(ii) මෙම උපකරණය මගින් මනිනු ලබන කාලගුණික අංගය කුමක්ද? (ල. 02)

(iii) එම කාලගුණික අංගය මනිනු ලබන ඒකකය කුමක්ද? (ල. 02)

(iv) කාලගුණික වාර්තාව ඉදිරිපත් කරනු ලබන ආයතනය නම් කරන්න. (ල. 02)

(v) කාලගුණික මූලිකාංග හතරක් නම් කරන්න. (ල. 04)

3) (i) ශාකවලින් ඇති ප්‍රයෝජන දෙකක් ලියන්න. (ල. 02)

(ii) සුළඟ මඟින් බෝවන ශාක වර්ග දෙකක් නම් කරන්න. (ල. 02)

(iii) රාත්‍රියේ හැසිරෙන සතුන් දෙදෙනෙක් නම් කරන්න. (ල. 02)


(iv) මදුරුවා විසින් බෝ කරනු ලබන රෝග දෙකක් නම් කරන්න. (ල. 02)

(v) පරිසරයේ ජීවත් වන සත්ත්වයින්ගෙන් ඇති ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න. (ල. 04)

4) (i) ඔබ ප්‍රදේශයේ ජීවත්වන ජන වර්ග දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) පහත දැක්වෙන සංකේත දෙක මගින් නිරූපණය වන ආගම් සඳහන් කරන්න. (ල. 02)

a. 

b. 

(iii) ඔබ ප්‍රදේශයේ ප්‍රජාවගේ දියුණුව උදෙසා පිහිටුවා ගෙන ඇති සමිති සමාගම් දෙකක් නම් කරන්න. (ල. 02)

(vi) ඉහත (iii) සඳහන් කරන ලද සමිති මගින් ඉටු කරන කාර්යයන් දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(v) විවිධ ජාතික හා ආගමික උත්සවවල දී අසල්වැසියන් සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතු ආකාරය කරුණු දෙකක් මගින් ලියන්න. (ල. 04)

5) (i) භූමියෙන් ලබා ගන්නා ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න. (ල. 03)

(ii) භූමිය අවිධිමත් ලෙස පරිහරණය නිසා ඇතිවන අයහපත් ප්‍රතිඵල තුනක් ලියන්න. (ල. 03)

(iii) ජල දූෂණය විය හැකි ආකාර තුනක් විස්තර කරන්න. (ල. 03)

iv) ජලය හිඟවීමෙන් ඇතිවන ගැටලු තුනක් සඳහන් කරන්න. (ල. 03)

6) (i) පහත සඳහන් රූප සටහනෙහි, රැස් කරන අපද්‍රව්‍ය නම් කරන්න.



a. කොළ පැහැති භාජනය

b. රතු පැහැති භාජනය

c. නිල් පැහැති බඳුන (ල. 03)

(ii) නිවසෙන් බැහැර කරනු ලබන කෘෂි අපද්‍රව්‍ය එකක් හා කාර්මික අපද්‍රව්‍ය දෙකක් සඳහන් කරන්න. (ල. 03)

(iii) අපද්‍රව්‍ය බැහැර කරලීමේ අවස්ථා තුනක් නම් කරන්න. (ල. 03)

(vi) ඔබ නිවසේ අපද්‍රව්‍ය අවම කර ගැනීම සඳහා යොදාගත හැකි උපක්‍රම තුනක් සඳහන් කරන්න. (ල. 03)

PAST PAPERS WIKI

7) (i) ඉන්දියාව සහ ශ්‍රී ලංකාව වෙන් කරනු ලබන සමුද්‍ර සන්ධිය නම් කරන්න. (ල. 02)

(ii) ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින පටු මුහුදු තීරයේ දුර කොපමණද? (ල. 02)

(iii) ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම ලියන්න. (ල. 4x2= 8)

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank